PEOPLE'S LEASING

පීපල්ස් ලීසිං | பீப்பள்ஸ் லீசிங்

විශ්වාසයේ ප්‍රමුඛයා

# පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී

(මහජන බැංකුවට අනුබද්ධිතය)

ෆිච් රේටිංස් ලංකා වෙතින් A+(lka) වර්ගීකරණය.

# 2022 මාර්තු 31 වන දිනෙන් අවසන් වූ වසර සඳහා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන

මෙම විගණන වාර්ථාව විගණකාධිපතිවරයා විසින් විගණනය කොට ඉංග්‍රිසි බසින් නිකුත් කරන ලද විගණන වාර්ථාවේ සිංහල අනුවාදයකි. ඉංග්‍රිසි අනුවාදය සහ ඕනෑම පරිවර්තන අනුවාදක් අතර අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට ඉංග්‍රිසි අනුවාදය සැමවිටම බලපවත්වනු ඇත.

සභාපති
පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වගන්තියට අනුව 2022 මාර්තු මස 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී, සහ එහි පරිපාලිත සමාගම්වල මූල්‍ය ප්‍රකාශන සහ අනෙකුත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ විගණකාධිපතිගේ වාර්තාව.

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

2022 මාර්තු මස 31 වන දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වන වර්ෂය සඳහා ලාභාලාභ ප්‍රකාශය, විස්තීරණ ආදායම් ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශයන් ඇතුළත් මූල්‍ය ප්‍රකාශන සඳහා වන සටහන්, 2022 මාර්තු මස 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා පිපල්ස් ලිසිං ඇන්ඩ් ෆිනැන්ස් පී.එල්.සී. (සමාගම) සහ පිපල්ස් ලිසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී. හි පරිපාලිත සමාගම්වල (සමූහය) මූල්‍ය ප්‍රකාශන විගණනය, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුව මාගේ මෙහෙයවීම යටතේ සිදුකරන ලදී. මෙම විගණනය කර ගෙන යාම සඳහා, පොදු ව්‍යවහාරය තුළ ක්‍රියාත්මක වන වරලත් ගණකාධිකාරී ආයතනයක් මා වෙත සහය විය.ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්තාවේ විධිවිධාන අනුව මාගේ වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ඇත.

මගේ මතය අනුව, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව 2022 මාර්තු මස 31 වන දිනට සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන සමාගමේ සහ සමූහයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වන වසර සඳහා එහි මූල්‍ය කාර්යසාධනය සහ මුදල් ප්‍රවාහ පිළිබඳ සත්‍ය සාධාරණ දැක්මක් ලබා දේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූලික විගණන කරුණු**

මූලික විගණන කරුණු වන්නේ පවත්නා කාලසීමාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනය තුළ වඩාත් සැලකිල්ලට ගනු ලැබූ කරුණු වේ. මෙම කරුණු සමාගමේ මූල්‍ය ප්‍රකාශන සහ සමස්තයක් ලෙස සමූහයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයේ අන්තර්ගතය තුළ ආමන්ත්‍රණය කරන ලද අතර ඒ සම්බන්ධව මගේ විගණන මතය සකස් කිරීම තුළ මෙම කරුණු සම්බන්ධයෙන් වෙනම මතයක් මම ලබා නොදෙමි.පහත සෑම කරුණක්ම මාගේ විගණනයේදී සැලකිල්ලට ගත් ආකාරය පිළිබඳ විස්තරය පහත වගුවෙහි දක්වා ඇත.

| ප්‍රධාන විගණන කරුණු | මූලික විගණන කරුණු මාගේ විගණනයෙන් ආමන්ත්‍රණය කරන ලද ආකාරය |
|---|---|
| **ණය සහ ලැබිය යුතු දේ සඳහා අපහායන වෙන්කිරීම්**<br><br>25 වැනි කරුණ මගින් එළිදක්වා ඇති ආකාරයට 2022 වර්ෂයේ මාර්තු 31 වැනි දින විට අපහායන වෙන් කිරීම් අඩුකල ශුද්ධ ණය හා ලැබිය යුතු ශේෂය රුපියල් මිලියන 163,321කි. එය සමූහයේ මුළු වත්කම් සඳහා 79% ක දායකත්වයක් දක්වයි.<br><br>ණය සහ ලැබිය යුතු දේ සඳහා අපහායන වෙන්කිරීම් ප්‍රධාන විගණන කරුණක් වන්නේ පහත සඳහන් හේතු නිසාය.<br>• සංකීර්ණ ගණනය කිරීම් සහිත වු වාර්ථා කරන ලද අපහායන වෙන් කිරීම් වල ප්‍රමාණාත්මතාව<br>• සටහන 25.7 පිලිබිඹු වන පරිදි කලමනාකාරීත්වය විසින් උපකල්පන සහ ඇස්තමේන්තු සඳහා වත්මන් වසරේ භාවිතා කරන සැලකිය යුතු විනිශ්චයන්, ඉදිරි දැක්ම තොරතුරු මත පවතින ආර්ථික තත්වයන්ගේ වෙනස්විම් ගණනය කිරීමේ අවශතාවය සහ Covid-19 ණය සහන පියවරවල අඛණ්ඩ බලපෑම යන කරුණු වලින් බලපෑමට ලක්විම. | මගේ විගණන ක්‍රියා පටිපාටිවල පහත සඳහන් දෑ ඇතුලත්විය<br>. අධ්‍යක්ෂ මණ්ඩලය හා කළමණාකාරිත්වය විසින් අපහායන වෙන් කිරීම්, ප්‍රතිපත්ති හා ක්‍රියා පටිපාටි සමාලෝචනය හා අනුමත කිරීමේ මට්ටම මම තක්සේරු කලෙමි.<br>. අපහායන වෙන්කිරීම තක්සේරු කිරීමෙදී භාවිතා වන අදාල පද්ධති පාලනයන් ඇතුළුව අභ්‍යන්තර පාලනයෙහි සැලසුම් කිරීම. ක්‍රියාත්මක කිරීම සහ මෙහෙයුම් ශක්‍යතාව ඇගයිම පරීක්ෂාවට ලක් කිරීම.<br>. මෙම සමූහයේ මූලාශ්‍ර ලේඛන හා ගිණුම් වාර්තා ඇතුලත් ලේඛණ, වලට අනුකූලව අපහායන ගණනය කිරීමේදී භාවිතා වූ දත්තවල සම්පූර්ණත්වය, නිරවද්‍යතාව හා වර්ගීකරණය පරීක්ෂා කලෙමි.<br><br>අපහායනය සඳහා සාමුහිකව තක්සේරු කල ණය හා ලැබිය යුතු දේ සඳහා :<br>. අපහායන වෙන්කිරීම් සඳහා භාවිතා කරන ලද ප්‍රධාන ගණනය කිරීම් පරීක්ෂා කරන ලදී.<br>. කළමණාකාරිත්වය විසින් සිදු කරන ලද උපකල්පන හා ඇස්තමේන්තු සඳහා භාවිතා කළ ක්‍රමවේදයන් නිවැරදිදැයි පරිකෂා කිරීම. එමෙන්ම ඉදිරි දැක්ම හා සම්බන්ධ තොරතුරු කොතරම් දුරට සාධාරණදැයි මම ඇගයීමට ලක් කලේමි. එහිදී එම තොරතුරුවල සාධාරණත්වය, සලකා බැලූ ආර්ථික අවස්ථා හා එම එක් අවස්ථා විය හැකි සම්භාවිතාවන්ද මම ඇගයීමට ලක් කලේමි. එම ක්‍රියා පිළිවෙල මාගේ වාර්තාව භාරදෙන දිනය දක්වා පවතින හොඳම තොරතුරු මත පදනම් විය.<br>. **අපහායනය සඳහා තනි තනිව තක්සේරු කල ණය හා ලැබිය යුතු පිළිබඳව**<br>. ණය ගැණුම්කරුගේ විශේෂිත තත්වයන් මත පදනම්ව ණය ආපසු ගෙවීමේ හැකියාව පිළිබඳ කළමණාරීත්වයේ අභ්‍යන්තර තක්සේරුවල සාධාරණත්වය හා කාලෝචිත බව තක්සේරු කරන ලදී<br>. අපහායනය සඳහා තනි තනිව තක්සේරු කල ණය සහ ලැබිය යුතු පිළිබදව ගණනය කිරීම් වල නිරවද්‍යතාව පරීක්ෂා කරන ලදී<br>. වත්මන් ආර්ථික තත්වයන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් සිදුකෙරෙන ලද ණය අපහායන වෙන් කිරීම් සඳහා බාවිතා කරන ප්‍රධාන යෙදෙවුම්වල නිරවද්‍යතාව ඇගයීම. විශේෂයෙන් වැඩි අවධානමක් ඇති කර්මාන්ත. නැවත අයකරගැනීමේ තත්වය හා ඇපකර අගයන් සම්බන්දයෙන් මුදල් ප්‍රවාහ පුරෝකථනයේ වටිනාතම හා කාළය සැලකිල්ලට ගනිමින් ඒවැනි ඇගයීම් සිදු කරන ලදී<br>. 11 හා 25 සටහන් වල දක්වා ඇති අදාළ මූල්‍ය ප්‍රකාශන හෙලිදරව් කිරීම් ප්‍රමාණවත් බව තක්සේරු කරන ලදී. |
| මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ තොරතුරු තාක්ෂණ මත පදම් වූ අභ්‍යන්තර පාලන<br><br>ආයතන සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලියේ සැලකිය යුතු කොටසක් මූලික වශයෙන් ස්වයං ක්‍රියාවලිය හා අභ්‍යන්තර පාලනයන් සහිත බහු තොරතුරු තාක්ෂණ පද්ධති මත රඳා පවතී.<br>තවද ප්‍රධාන මූල්‍ය ප්‍රකාශන හෙලිදරව් කිරීම් සම්පාදනය කරනු ලබන්නේ පැතුරුම්පත් භාවිතයෙන් සම්පාදනය කර සකස් කරන ලද දත්ත හා වාර්තා භාවිතා කරමිනි.<br><br>මේ අනුව, මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ තොරතුරු තාක්ෂණ පදනම් වූ අභ්‍යන්තර පාලනය ප්‍රධාන විගණන කරුණක් ලෙස සැලකේ. | මගේ විගණන ක්‍රියාවලිය සඳහා පහත සඳහන් දෑද ඇතුලත්විය.<br>• මූල්‍ය වාර්තාකරණය හා අදාල හෙලිදරව් කිරීම් සම්බන්ධ ක්‍රියාවලියේ අභ්‍යන්තර පාලන තත්වය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම.<br>• ආයතන සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලියට අදාල ප්‍රධාන තොරතුරු තාක්ෂණ පද්ධතිවල පාලනය කිරීම් හඳුනාගෙන පරීක්ෂා කර ඇත.<br>• පරිශීලකයින් ප්‍රවේශය හා ගතික කළමණාකරණයට අදාළව ඒවා ඇතුළුව තොරතුරු තාක්ෂණ පාලනයන් සැලසුම් හා මෙහෙයුම් කාර්යක්ෂමතාවය ඇගයීමට ලක්කරන ලදී<br>• ප්‍රධාන ලෙජර් ප්‍රතිසන්ධාන සමාලෝචනය ඇතුළුව නිරවද්‍යතාව සහ සම්පූර්ණත්වය වෙනුවෙන් ප්‍රධාන හෙලිදරව් කිරීම් උත්පාදනය කිරීමට භාවිතා කරන වාර්තාවල ප්‍රධාන මූලාශ දත්ත පරීක්ෂා කරන ලදී. |

**1.4 සමූහයේ 2022 වාර්ෂික වාර්තාවට ඇතුළත් වෙනත් තොරතුරු.**

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන සමාගමේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ . මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට (අදාළ වන පරිදි) කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීම්යි.

මම මෙම ආයතන සමූහයේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණත්මක සාවද්‍ය ප්‍රකාශ සඳහන්වී ඇති බව මා නිගමනය කලහොත්, එම කරුණු නිවැරදිකර ගැනීම සම්බන්ධයෙන් මා ආයතනයේ පාලනාධිකාරිය සමග අදහස් හුවමාරු කරගත යුතුයි. තවදුරටත් නිවැරදි නොකළ ප්‍රමාණත්මක සාවද්‍ය ප්‍රකාශ තිබේනම්, ඒවා නියමිත වේලාවට ඉදිරිපත් කරනු ලබන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව මම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන වාර්තාවට ඇතුලත් කරනු ඇත.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථානෝචිත උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථානෝචිත උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හදුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

**2. වෙනත් නීතිමය හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තා**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ

- 2007 අංක 7 දරන සමාගම් පනතේ 163 (2) (ඈ) වගන්තියේ සහ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා පවත්වාගෙන ගොස් තිබුණි.
- සමාගමේ මූල්‍ය ප්‍රකාශන, 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියෙහි අවශ්‍යතාවයන්ට අනුකූල වේ.
- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.
- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇති
-

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය සමාගමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සමාගම සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.
- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අඳාල ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.
- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.
- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

(අ.ක.ල)
ඩබ්ලිව්, පී. සී. වික්‍රමරත්න
විගණකාධිපති
2022 ජුනි 27